# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2190/19 - 2020 අගෝස්තු මස 24 වැනි සඳුදා - 2020.08.24

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

### 2012 අංක 22 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනතින් සංශෝධිත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66උ වගන්තිය සමග කියවිය යුතු 66ඇ වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

බස්නාහිර පළාතේ පළාත් පාලන කොමසාරිස් කසුන් ඇපා සෙනෙවිරත්න වන මම 2012 අංක 22 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනතින් සංශෝධිත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66උ වගන්තිය සමග කියවිය යුතු 66ඇ වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව බස්නාහිර පළාත තුළ පිහිටියා වූ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාවෙහි පුරප්පාඩු වී ඇති නගරාධිපති ධුරය සඳහා අළුත් නගරාධිපතිවරයෙකු තෝරා පත් කර ගැනීමේ කාර්යය සඳහා වන රැස්වීම 2020ක් වූ සැප්තැම්බර් මස 15 දින පෙ. ව. 09.30 ට නො. 06, නාවල පාර, රාජගිරිය ලිපිනයෙහි පිහිටි ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාවේ සභා රැස්වීම් ශාලාව යන ස්ථානයේ දී කැඳවනු ලබන බව මෙයින් නිවේදනය කරමි.

**කසුන් ඇපා සෙනෙවිරත්න,**
පළාත් පාලන කොමසාරිස්,
බස්නාහිර පළාත.

2020 අගෝස්තු මස 20 වැනි දින,
බත්තරමුල්ල, අංක 204,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතෙහි පිහිටි,
බස්නාහිර පළාතේ පළාත් පාලන දෙපාර්තමේන්තුවේ දී ය.

09 - 192

1A - PG 5098 — 27 (2020/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*